// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/5 - 2012 ඔක්තෝබර් මස 02 වැනි අඟහරුවාදා - 2012.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2012)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2012 සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,<br>
ලේකම්,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 28 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### යෝජනාව

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට, (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව, හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයෙහි විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

### උපලේඛනය

| ශීර්ෂ අංකය<br>1 | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>2 | | විස්තරය<br>3 | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය<br>6 |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය<br>4 | සාමාන්‍ය<br>5 | |
| 22.07 | | | පරිමාව අනුව මධ්‍යසාර සැර ප්‍රමාණයෙන් 80%ක හෝ ඊටවැඩි මධ්‍යසාර ප්‍රමාණයක් ඇති ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මධ්‍යසාරය, කවර සැර ප්‍රමාණයකින් හෝ ස්වභාවය වෙනස් කළ ඊතයිල් මධ්‍යසාරය සහ අනෙකුත් ස්ප්‍රීතු | | | |
| | 2207.10 | - | පරිමාව අනුව මධ්‍යසාර සැර ප්‍රමාණයෙන් 80%ක හෝ ඊටවැඩි මධ්‍යසාර ප්‍රමාණයකින් යුත් ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මධ්‍යසාරය | | ලීටරයට රු. 200/- | ලීටර් |

10 - 716

1A - G 16696— 345 (2012/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.